සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

ශ්‍රේණිය - 10 | විෂය - කෘෂි හා ආහාර තාක්ෂණය | සතිය - සැප්තැම්බර් 05 සතිය

01) බෝග වගා කිරීමේදී මතුවන ප්‍රධාන ගැටළුව වන්නේ පළිබෝධ පාලනය කිරීමයි. එම පළිබෝධ හඳුනාගෙන ක්‍රියා කිරීමෙන් අපේක්ෂිත බෝග අස්වනු ලබා ගත හැකිය.

1. (අ) ප්‍රධාන පළිබෝධ කාණ්ඩ නම් කරන්න.

   (ආ) වගා නොකළ බිමක වල් පැළෑටි තිබීමෙන් ලැබෙන ප්‍රයෝජන හතරක් ලියන්න.

2. රූපකාරය අනුව වල් පැළෑටි ආකාර තුනකි. පහත දී ඇති වල් පැළෑටි භාවිතා කර වගුව සම්පූර්ණ කරන්න.

   (ඇටවරා, කළාඳුරු, තුන්හිරියා, තුනැස්ස, බටදැල්ල, බලුනකුට, වෙල්මාරුක්, දිය සියඹලා)

| තෘණ වර්ග | පත් වර්ග | පළල් පත්‍ර |
|---|---|---|
| ................................ | ................................ | ................................ |
| ................................ | ................................ | ................................ |

3. (අ) ශාක රෝගයක් යනු කුමක්ද ?

   (ආ) ශාකයකට රෝගයක් වැළදීම සඳහා සම්පූර්ණ විය යුතු කරුණු තුන සඳහන් කරන්න.

02) ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වූ බත සපයන්නේ වී ශාකයෙනි.

1. (අ) වී වගාව ශ්‍රී ලංකාවට වැදගත් වන ආකාර දෙකක් ලියන්න.

   (ආ) ශ්‍රී ලංකාවේ පාරම්පාරික වී ප්‍රභේද තුනක් නම් කරන්න.

2. (අ) පාරම්පරික වී ප්‍රභේදයක හා වැඩි දියුණු කළ වී ප්‍රභේදයක ලක්ෂණ දෙක බැගින් ලියන්න.

   (ආ) වී වගාවේදී සකසනු ලබන තවාන් වර්ග තුනකි. ඒ මොනවාද ?

3. බිත්තර වී වල තිබිය යුතු ප්‍රමිති තුනක් සඳහන් කරන්න.